# පෙරමග

1992
ජනවාරි




සාක්
සභාපතිත්වය
හා
පදවි
ප්‍රාප්තිය



පරි. අංක
වර්ග ...





ශ්‍රීමත් ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ පදවි ප්‍රාප්ති මංගල්‍යය වෙනුවෙන් අසරණ දරු දැරියන් දෙදහසකට සෙවණ සරණ මව්පිය කැපකරු ක්‍රමය යටතේ තිළිණ පත් ලැබිණ. මේ එවැනි දරුවකුට ත්‍යාග පාර්සලයක්ද සමඟ තිළිණ පත තිළිණ කළ මොහොතයි. හේමා ප්‍රේමදාස ආර්යාවද, අග්‍රාමාත්‍ය ඩී.බී විජේතුංග මැතිතුමාද,රෝහාන් ජයකොඩි සහ එස්. ජිනදාස මහතාද ඡායාරූපයෙහි වෙති.

★★★

ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ පදවි ප්‍රාප්ති මංගල්‍යය ඓතිහාසික මහනුවර දළදා මාලිගය ඉදිරිපිට අති විශාල ජනකායක් මධ්‍යයෙහි සැමරිණ. මේ එහිදී ඉදිරිපත් වූ සංස්කෘතික සංදර්ශනය නරඹන්නට රැස්වූ අතිවිශාල ජනකායෙන් කොටසකි.

# සාක් සභාපතිත්වය සාෆ් ජයග්‍රහණය හා පදවි ප්‍රාප්තිය

ශ්‍රී ලංකා රාජ්‍ය නායක ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා මේ මස 3 වැනිදා සිය පදවි ප්‍රාප්තියේ 3 වැනි සංවත්සරයට සහභාගි විය. වත්මන් ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තිය ශ්‍රී ලංකාවේ දුගී දුප්පත් ජනතාවගේ පදවි ප්‍රාප්තිය සේ සැළකෙන නිසා මෙම දිනය 'මහජන දිනය' යනුවෙන් නම් කරන්නේ නම් මැනවි යයි මට සිතේ. ඊට ප්‍රධානතම හේතුව නම් මේ ජනාධිපතිවරයා සැබවින්ම දුගී දුප්පත් මහජනතාව විසින් සිය ජීවිත පරදුවට තබා පත්කළ එකම හා ප්‍රථම ජනාධිපතිතුමා වීමය. මේ රටේ දුක්විඳින ජනතාව නියත වශයෙන්ම සිය ඡන්දය එතුමාට පාවිච්චි කළේ පක්ෂය අභිබවා ගිය ප්‍රතිරූපයක් ආර්. ප්‍රේමදාස නමැති දේශ සේවකයා සතුවූ බැවිනි.

වලව්වෙන් වලව්වට මාරුවී ගිය රාජ්‍ය නායකත්වය පොදු ජනතාව අතරින් මතුවූවකු අතට පත්වන්නට යන ප්‍රථම අවස්ථාව 1988 ජනාධිපතිවරණය බව අත්දැකීමෙන් දැනගැනීමට තරම් අපේ රටේ පොදු ජනතාවට බුද්ධි මහිමය තිබිණ. ඡන්දය දෙන්නට ගියහොත් මරාදමන බවටත්, රැස්වීමට යන කෙනාගේ පවුලම ඝාතනය කරන බවටත් ලිඛිතව දන්වා විසුරුවා හැර තිබියදීත් මේ රටේ පොදු ජනතාව සිය ජීවිත ගැනවත් සිය පවුල් ගැනවත් නොතකා ඒ සියලු තර්ජන ගර්ජන මධ්‍යයෙහි නොසැලී සිය අයිතියවූ ඡන්දය භාවිතා කළේ පුථමයෙන්ම ආර්. ප්‍රේමදාස නමැති නායකයාටත් දෙවනුව මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැකගැනීමටත්, තෙවනුව එ. ජා. පක්ෂය ජයග්‍රහණය කරවීමටත් යැයි නොබියවම කිවහැක.

ශ්‍රීමත් ජනාධිපතිතුමා බලයට පත්වී වසරක් පමණ යනතුරු මේ රටේ භීෂණ බලධාරීන් එතුමාට කිසිම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන්නට නුදුන් බව රහසක් නොවේ. වසරක් අපතේ යැමෙන් පසු ඉතිරි වූ වසර දෙක තුළ අභිමි අවුරුද්දේ පමණක් නොව ඊට පෙර අවුරුදුවල පවා තිබූ කඩතොලු මකාදමමින් පිළිසකර කරමින් අලුත් චින්තනයක්ද රටට බිහිකරමින් තෙවැනි සංවත්සරයට පා තැබීමට ශ්‍රීමත් ජනාධිපතිතුමා සමත් වී ඇත. සම්පූර්ණයෙන්ම විනාශ වී දූවිලි වී ගිය නෂ්ඨාවශේෂයන් තුළින් යළි නැගී සිටීමට හැකි ජනතාවක් බිහිකිරීමට හැකිවීමම එතුමාගේ සේවය ඉතිහාසගත කරන සිද්ධියකි.

දුප්පත් ජනතාව විසින් දුක් කඳුළු සෝ සුසුම් මැදින් මහ මග තැනින් තැන වැටී තිබුණු මළකඳන් පසුකරමින් තමන්ගේ පවුලේ කවර හෝ සාමාජිකයකු අහිමිවී හෝ අහිමි කරන බවට තර්ජනද තිබූ යුගයක ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති පදවියට පත්කිරීමද, බලයට පත්වූ පසු එතුමා ඊට ප්‍රතිඋපකාරයක් වශයෙන් සිය සේවය නැති බැරි දුගී දුප්පත් සමාජයේ අන්තිමයා සේ සැළකෙන අසරණයන් නගා සිටුවීමට මෙහෙයවීමද නිසා එතුමාගේ පදවි ප්‍රාප්තිය එතුමාගේ නොව පොදු ජනතාව සිංහාසනාරූඪවීම සේ සඳහන් කළ හැකිය. එය එසේ නම් මෙදවස සැළකිය යුත්තේ ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තියේ තෙවැනි සංවත්සරය ලෙස නොව සමස්ත පොදු ජනතාව පදවි ප්‍රාප්ත වූ දිනය ලෙසය. එය පොදු ජන දිනය හෝ මහජන දිනය ලෙස නම් කිරීම ඉතා සුදුසු යැයි මට හැඟෙයි.

රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා සාක් සමුළුව කල්යෑම ගැන කණගාටුවට පත්වන්නේ දැයි පුවත්පත් කලාවේදියකු නැඟූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් තමා කණගාටුවන්නේ බොහෝම කලාතුරකිනැයි පිළිතුරු දී තිබිණ. එය නම් පරම සත්‍යයකි. ඊට හේතුව සමුළුව කල්යෑම යෝ නොපැවැත්වීම එතුමා තුච්ඡවූවකටවත් ගණන් නොගැනීමය. සමුළු පවත්වනවා යැයි කල්තියා දැනුම් දුන්කළ ඊට ඉතා ඉහළින් සූදානම් වූ එතුමා කල්තැබුවා යැයි ආරංචි වූ විට පැමිණි රාජ්‍ය නායකයන් සමඟ එක්වී ද්විපාක්ෂික සාකච්ඡා පවත්වා සැලසුම් කළ සැණකෙළිද ඒ ලෙසින්ම පවත්වා සතුටින් විසිර යන්නට තරම් නොසැලෙන පෞරුෂයක් ප්‍රදර්ශනය කළේය. ඊට හේතුව නම් සමුළුව පැවැත්වීමට හිස කල් තැබීම හෝ අවලංගු කිරීම එතුමාගේ කාර්යයක් නොවූ බැවිනි.

ශ්‍රීමත් ජනාධිපතිතුමා සියල්ල සිදුවන්නේ හොඳට යැයි අදහන නායකයෙකි. මේ නිසාම සමුළුව අවලංගු කිරීමට හෝ කල් තැබීමට හෝ ක්‍රියාකළ අයට අපේ දේශයට යළි පැමිණීමට සිදුවිය. කල් දැමීමට හේතු ඉදිරිපත් කළ අයද ඔවුනට එම හේතුව යෝජනා කළ අයද සමුළුවට සහභාගි වූහ. මෙමගින් සාක් රාජ්‍ය නායක සමුළුව එකම වසරක දෙමසක් ඇතුළත අර්ධව හා පූර්ණව දෙවරක් පැවැත්වූ රට හැටියට ශ්‍රී ලංකාව ඉතිහාස ගතවෙයි. එම ඉතිහාසයෙහි දැවැන්ත සෙවණැල්ල වනුයේ ශ්‍රී ලංකාවේ ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමාය. දෙවැනි වරට පැවැති අංගසම්පූර්ණ සමුළුවට සහභාගි වූ විදේශීය රාජ්‍ය නායකයෝ සාක් කලාපීය නායකත්වය අපේ පුංචි ලංකාවේ පොදු ජන නායක ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා වෙත ප්‍රදානය කළහ. මේ සිද්ධියේදී යම් රටක් විසින් මුල් සමුළුව කඩාකප්පල් කළාද පාරාවලල්ලක් මෙන් එය යළි ඔවුන් වෙතම පෙරළා පැමිණියේ හරියටම තමන් ඇටවූ උගුලට තමන් අසුවූවාක් මෙනි. බලය හා ශක්තිය ප්‍රදර්ශනය කරන්නට ගත් උත්සාහය අවසන් වූයේ කොපමණ විශාල වුවද බලවත් වුවද ශක්තිමත් වුවද පුංචි රටකට පාඩම් උගන්වන්නට යැමෙන් මහ රටකට පාඩම් ඉගෙන ගන්නට සිදුවීමෙනි. මේ බලවත් පාඩම් ඉගෙන ගත්තේ සුළු වශයෙන් නොව මහා පරිමාණයෙනි. කලාපීය රටවලටත් මුළු ලෝකයේම සෙසු රටවලටත් තමන්ගේ ඇති අන්ත දුබල බව මනාව ප්‍රදර්ශනය කිරීමෙනි.

ශ්‍රී ලංකාවේ ජීවත්වන පටු දේශපාලනඥයන් බොහෝදෙනා සමුළුව නොපැවැත්වූ දිනවල සිටියේ බලවත් ප්‍රීතියෙනි. හේතුව තම රටට ජාතියට දේශයට නායකයාට වඩා අසල්වැසියන්ගේ බල පරාක්‍රමය ශක්තිය එරට නායකයන්ට ආවැඩීමට ඔවුන් පුරුදු පුහුණු වී සිටීමය. මේ අය කෙතරම් දිනදැයි කිවහොත් නොබැඳි සමුළුවට මෙතරම් රාජ්‍ය නායකයන් ගෙන්වා ගැනීමට හැකි වූ ශ්‍රී ලංකාවට මෙවර රටවල් 7ක නායකයන් රැස්කරගත නොහැකි විණැයි වහසි බස්ද දෙඩූහ. සාක් නායකත්වය ශ්‍රී ලංකාවට ලැබීමේ ගෞරවය අහිමිවීම ගැන කණගාටු වනවා වෙනුවට මොවුනට එතුළින්ද වුවමනා වූයේ ජාතියේ දේශයේ ගෞරවය කෙසේ බිඳවැටුණත් තමන්ගේ දේශපාලන වාසියට එය හරවා ගැනීමය.

ජනාධිපතිතුමා එහිදිද නිහඬ විය. කලාතුරකින්වත් එළඹෙන කණගාටුවද එතුමා වෙත නාවේය. එතුමා මහේ බලා සිටිද්දී මාලදිවයින් ජනාධිපතිතුමා හැම සාමාජික රටකටම කතාකොට දෙසැම්බර් 21දා සමුළුව පවත්වන්නට යෝජනා කළේය. ගිය වාරයේ මෙන්ම මේ වාරයටද සමුළුව පැවැත්වීමට ජනාධිපතිතුමා එකඟවිය. සමුළුව පවත්වා එතුමාට සාක් සමුළුවේ රටවල් 7ක නායකත්වය ප්‍රදානය කැරිණ.

සාක් සමුළුව පැවැති කිසිම රටක සාෆ් ක්‍රීඩා උළෙල වෙනුවෙන් රාජ්‍ය නායකයෝ සහභාගි නොවූහ. එහෙත් පැමිණ සිටි රාජ්‍ය නායකයන්ගෙන් සිව් දෙනෙක්ම ශ්‍රී ලංකාවේ පැවැති අන්තර් ජාතික සාෆ් ක්‍රීඩා තරගාවලියේ ආරම්භක උත්සවයටද සහභාගි වූහ. මෙයද ශ්‍රී ලංකාවේ කීර්තියට කුඩුදුන් වැදගත් සිදුවීමකි. අනෙක් කිසිම රටකට සාක් උළෙල වෙනුවෙන්



ජනතාව විසින් ජනතාව සඳහා ජනතා බලය ජනතා පුත්‍රයකු වෙත පිරිනමා ජනවාරි 3වැනිදාට වසර 3ක් සපිරිණි. ජනපති පදවි ප්‍රාප්තිය යනු මේ රටේ පොදු ජනතාව කිරුළු පැළඳූ මොහොතයි. හරියටම මීට වසර 3කට පෙර ශීෂණයේ උපරිමයෙන් බැට කමින් සිටි මෙරට පොදු ජනතාව සිය ජීවිත පරදුවට තබා තම අභිමතාර්ථ සාධනය කර ගත්හ. 1948 නිදහසින් පසු පැවැති අති තීරණාත්මක මැතිවරණය ලෙස 1988 ජනාධිපතිවරණ ඉතිහාසගතය. වත්මන් ජනාධිපතිතුමා විජයග්‍රහණය කළේ පොදු ජන ආවේගයන් හා ප්‍රාර්ථනයන්ගේ ප්‍රතිඵලයෙනි.

ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා පදවියෙහි දිවුරුම් දුන්නේ පෙර රජදරුවන් සිරිතෙහි පිහිටමින් ඓතිහාසික පත්තිරිප්පුවේදීය. දළදා සම්බුදුන් වැඩ සිටින සාදු නද දෝංකාරය දෙන දළදා මාළිගය බෞද්ධ පැදැහැවතුන්ගේ මුදුන් මල්කඩය. දළදා මාළිගයේ ඓතිහාසික පත්තිරිප්පුවේ සිට ජන සේවයේ පදවි ප්‍රාප්ති මංගල්‍යයේ 3වැනි සාංවත්සරය ඇමතීමට මොහොතකට පෙර ශ්‍රී ලංකා රාජ්‍ය නායක ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා තමා වෙත පිදෙන මහජන පුජෝපහාරය දෙස සොම්නස් සිතින් බලා සිටියි. හේමා ප්‍රේමදාස ආර්යාවද අග්‍රාමාත්‍ය ඩී. බී. විජේතුංග මැතිතුමාද නෙරංජන් විජේරත්න දියවඩන නිලමේ තුමා සහ එම මැතිනියද ත්‍රිවිධ හමුදාපතිවරුද එතුමා අසල වෙති.

---

නොලද උත්තම අවස්ථාවක් ශ්‍රී ලංකාවට ලැබිණ. 'ඒ කොයි දේ වෙන්නෙත් හොඳට යයි' ශ්‍රීමත් ජනාධිපතිතුමා සිතන සිතුවිල්ල සාක්ෂාත් වීමකි. යම් හෙයකින් රාජ්‍ය නායක සමුළුව නොවැම්බර් මාසයේ දී පැවැත්විණි නම් සාප් උළෙල විවෘත කරන විට විදේශීය රාජ්‍ය නායකයන් මෙම උළෙලට සහභාගි නොවනු ඇත.

ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ මෙරට ක්‍රීඩක ක්‍රීඩිකාවෝ අන් කවර වරෙකටත් වැඩියෙන් සිය දක්ෂතා විදහා දැක්වූහ. ප්‍රථමවරට අපේ රටේ ගම්බද පළාත්වලින් නාගරයට පැමිණ ක්‍රීඩා කළ අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ශ්‍රී ලංකාවට ඉමහත් කීර්තියක් අත්පත් කර දෙමින් රන් පදක්කම් 44ක්ද රිදී පදක්කම් ලොකඩ පදක්කම් සංඛ්‍යාවක්ද අත්පත් කර දුන්හ.

සත්‍යය ජය සේවයේ පාඨය ලෙස තෝරාගෙන ඇති ජනාධිපතිතුමා අති දරුණු දේශපාලන කුමන්ත්‍රණයකින් එගොඩ කරවූ ලැබුවේද එම සත්‍යයම විසිනි. දැන් ඒවා මැඩගෙන එතුමා තව නවත් ජාතික මෙහෙයට කැපවී සිටියි. දෝෂාභියෝග කුමන්ත්‍රණයෙන් මිදීමට එතුමාට හැකිවූයේ ද මේ රටේ පොදු ජනතාව විසින් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට කළ කැපවීම හා මෙහෙය නිසාය. අල්ප ප්‍රමාණයක් වූ සැපවිඳින්නන්ට නොව අප්‍රමාණ වූ දුක් විඳින්නන්ට සේවය සැලසීම එතුමාගේ අභිලාෂය වී ඇත. එම අභිලාෂය හමුවේ ඉදිරියේදී තව නවත් අභියෝග කුමන්ත්‍රණ අප්‍රමාණව ඉදිරිපත්වීමට හොඳටම ඉඩ ඇත. සත්‍යය දර්ශනය කරගත් කල්හි සේවය පොදු ජනතාව සඳහා කැපවූ කල්හි එළඹෙන අභියෝග කුමන්ත්‍රණ හිරුදුටු පිනිමෙන් වියැකෙනු ඇත.

වශීකර

## රුවන්වැකි

අවස්ථාවක් ලැබී නොදුන්විට දක්ෂකම් පෙන්විය නොහැකිය.
– නැපෝලියන්

* අප සමත් යයි උදම්වූවත්තේ අපට කළ හැකි වෙතියි සිතෙන දේවල් ගැන තක්සේරු කරමිනි. එහෙත් සෙසු අය අපේ සමත්කම් ගැන නිර්ණය කරන්නේ අප මේතාක් කර තිබෙන දේවල් ගැන සලකා බලමිනි.
– ලෝංෆෙලෝ

# කොළඹ සමුළුවෙන් පසුව......

## එඩ්වින් ආරියදාස

'සාක්' යන පදය අද ඉංගිරිසියෙහි මෙන්ම සිංහලයෙහිද ඉතා සුවසේ වෙසෙන වචනයකි. මෙය තැනෙන්නේ 'සවුත් ඒසියන් ඇසෝෂියේෂන් ඔෆ් රීජනල් කෝපරේෂන්' යන ඉංගිරිසි පද සමූහයේ මුල් අකුරු එක්වීමෙනි..ඒ පද මාලාවේ සිංහල අරුත මෙසේය. දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය'

සාක් සංවිධානයට අයත් රාජ්‍ය හතකි. ඒවා නම් බංග්ලාදේශ රාජ්‍යය, භූතානය, ඉන්දියාව, මාලදිවයින් රාජ්‍යය, නේපාලය, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාවත්ය.

මේ රාජ්‍ය හතේ නායකයන්ගේ ප්‍රථම ඉහළ මට්ටමේ සමුළුව පැවැත්වූයේ 1985 දී බංග්ලාදේශ් රාජ්‍යයේයි. ප්‍රථම ඉහළ මට්ටමේ සමුළුව බංග්ලාදේශ් රාජ්‍යයේ අගනුවර වන ඩකා හි පැවැත්වීමට විශේෂ හේතුවක් තිබුණේය. දකුණු ආසියානු සහයෝගිතා සංවිධානයක් පිහිටුවාලීම පිළිබඳ මූලික අදහස පළමුවෙන්ම ප්‍රකාශ කරන ලද්දේ බංග්ලාදේශ් රාජ්‍යයේ හිටපු ජනාධිපතිවරයෙකු වන සියා උර් රහ්මාන් විසිනි. බංග්ලාදේශ් රාජ්‍යය වර්තමාන අගමැතිනිය වන ඛලීඩා සියා මහත්මිය, හිටපු ජනාධිපති සියා උර් රහ්මාන්ගේ භාර්යාවයි.

1985 දී බංග්ලාදේශ්හි රාජ්‍ය නායකව සිටි හිටපු ජනාධිපති හුසේන් මොහමඩ් එර්ෂාද්, සාක් රාජ්‍ය නායකයන්ගේ ප්‍රථම ඉහළ මට්ටමේ සමුළුව කැඳවූයේය. 1985 දෙසැම්බර් හත්වනදා සහ අටවනදා පැවැත්වුණු ඒ සමුළුව ඓතිහාසික එකතුවක් වූයේ සාක් සංවිධානයේ ප්‍රඥප්තියට අත්සන් තබන ලද්දේ ඒ සමුළුවේදී හෙයිනි.

### ප්‍රඥප්තිය

දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයේ අනාගතය පිළිබඳ සැළැස්ම වශයෙන් සැළකිය යුතු වන්නේ ඒ ප්‍රඥප්තියයි. ඒ මුල් ප්‍රඥප්තියට අත්සන් තැබූ රාජ්‍ය නායකයන් සත්දෙනා නම් බංගලාදේශ්හි ජනාධිපති හුසේන් මොහමඩ් එර්ෂාද් භූතානයේ රාජ්‍ය නායක ජිග්මේ සින්ගි මොංචුක් රජු, ඉන්දියාවේ අගමැති රජිව් ගාන්ධි, මාලදිවයින් ජනාධිපති මවුමූන් අබ්දුල් ගයූම්, නේපාලයේ රාජ්‍ය නායක බිරේන්ද්‍ර බීර් බික්‍රම් ෂාදේව් රජු, පාකිස්තානයේ ජනාධිපති සියාඋල් හක් සහ ශ්‍රී ලංකාවේ ජනාධිපති ජේ. ආර් ජයවර්ධනත්ය.දෙවන සාක් රාජ්‍ය නායක සමුළුව පැවැත්වූයේ, 1986 දී ඉන්දියාවේ බැංගලෝර් නගරයේයි. ප්‍රථම සමුළුවට සහභාගී වූ රාජ්‍ය නායකයන් සත්දෙනාගෙන්, ඉන්දිය සමුළුවට සහභාගි නොවූයේ එක් රාජ්‍ය නායකයෙක් පමණි. ඔහු නම්, පාකිස්තාන ජනාධිපති සියාඋල් හක් ය. ඒ වෙනුවට එවකට පාකිස්තාන අගමැතිව සිටි මොහමඩ් ජුනේජෝ ඉන්දිය සමුළුවට සහභාගි වූයේය.

සාක් රාජ්‍ය නායකයන්ගේ තෙවන ඉහළ මට්ටමේ සමුළුව පැවැත්වූයේ නේපාලයේ ඛත්මන්ඩු නගරයේයි. ඒ 1987 දිය.


1988 දී සිව්වන සාක් රාජ්‍ය නායක සමුළුව පැවැත්වූයේ, පාකිස්තානයේ ඉස්ලාමාබාද් නගරයේයි. එහිදී, පාකිස්තාන රාජ්‍ය නායිකාව වශයෙන් සමුළුවේ මුලසුන හොබ වන ලද්දේ එවකට පාකිස්තාන අගමැතිනියව සිටි බෙනාසීර් භූතෝ මහත්මිය විසිනි. ලෝකයේ ප්‍රථම මුස්ලිම් අගමැතිනිය වූයේ බෙනාසීර් භූතෝ මහත්මියයි.

1989 වර්ෂයේදී සාක් රාජ්‍ය නායක සමුළුවක් පැවැත්වූයේ නැත.

පස්වන සාක් රාජ්‍ය නායක සමුළුව, 1990 දී මාලදිවයින රාජ්‍යයේ අගනුවර වන මාලේහිදී පැවැත්විණි. එහි මුලසුනේ සිටියේ මාලදිවයින් හි ජනාධිපති මවුමූන් අබ්දුල් ගයූම්ය. මාලදිවයින් රාජ්‍යය ස්වෛරීත්වය ලබා අවුරුදු 25ක් පිරුණේ 1990 දී හෙයින්, මාලේ නගරයේදී එදා එය පැවැත්වීම ඉතා උචිත සේ සැලකිණි.



ජේ. ආර් ජයවර්ධන මහතා



සියාඋල් හක් මහතා



හුසේන් මොහමඩ් එර්ෂාද් මහතා

1991 නොවැම්බර් මාසයේදී කොළඹදී පවත්වන්නට නියමිතව තිබිණි. එහෙත්, රාජ්‍ය නායකයන් කිහිප දෙනෙකුට එයට සහභාගිවිය හැකි නොවීම නිසා සවන රාජ්‍ය නායක සමුළුව 1991 දෙසැම්බර් විසිඑක්වන දින පැවැත්විණි. කොළඹ සමුළුවේ විශේෂ ලක්ෂණය වූයේ, සාක් රාජ්‍ය නායකයන් පස් දෙනෙක් සහ අනික් රාජ්‍ය නායකයන් දෙදෙනාගේ නියෝජිතයනුත් 1991 දෙසැම්බර් 22 වන දින, සාක් ක්‍රීඩා උළෙලෙහි සමාරම්භක අවස්ථාවට සහභාගිවීමයි.

### ඉතිහාසය

අවුරුදු හයක ඉතිහාසයක් සහිත සාක් සංවිධානය, ලෝකයේ කලාපීය සංවිධානයන්ගේ ප්‍රභවයට තරමක් වෙනස්ය. 'ආසියන් සංවිධානය' (දකුණු ආසියානු රාජ්‍යයන්හි සංවිධානය) යන නමින් දකුණු ආසියාවේ රාජ්‍ය හයක් එකට එකතුව සිටිති. මුලින් මේ සංවිධානයේ සාමාජික රාජ්‍ය ගණන 5ක් විය. ඒ රාජ්‍ය පහ එදා එකට එකතුවූයේ කොමියුනිස්ට් බලවේගයේ ව්‍යාප්තිය පිළිබඳ තර්ජනයට සාමූහිකව මුණපෑමේ ප්‍රයත්නයක් වශයෙනි.

යුරෝපා වෙළඳ හවුල ආරම්භ වූයේත්, එවකට ලෝකයේ සුපිරි බලවතෙකු වූ සෝවියට් රුසියාව, බටහිර දෙසට ව්‍යාප්තවීමේ තර්ජනයට ඔරොත්තු දී සිටීමේ අරමුණෙනි. එහෙත්, සාක් සංවිධානය එවැනි බාහිර තර්ජනයක් නිසා හටගත්තේ නොවේ. එහි මූලික අරමුණ වූයේ සාක් රාජ්‍ය හත සතු විවිධ ප්‍රශ්න සාමූහිකව නිරාකරණය කොට ගනිමින්, සාමකාමී සහජීවන ප්‍රතිපත්තියක පිහිටා මේ දේශයන්හි ප්‍රගතිය සලස්සා ගැනීමයි.

මෙසේ එකට එකතුව සිටින රාජ්‍ය හත, විවිධ ලක්ෂණ සහිතයි. භූගෝලීය පිහිටීමට අනුව, මේ රාජ්‍ය හතෙන් පහක්ම, එකම භූමි ඛණ්ඩයකට අයත්ය. ඒ රාජ්‍ය පහ නම් බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, නේපාලය සහ පාකිස්තානයයි. මාලදිවයින් රාජ්‍යය හා ශ්‍රී ලංකාව ඉන් බැහැර, වෙන වෙනම පිහිටියේ වේ.

බංග්ලාදේශ්, පාකිස්තාන හා මාලදිවයින් යන රාජ්‍ය තුනේ නායකයෝ මුස්ලිම් භක්තිකයෝයි. නේපාල, ඉන්දියා යන රාජ්‍ය දෙකේ නායකයෝ හින්දු භක්තිකයෝ වෙති. භූතානයේ සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයෝ බෞද්ධයෝයි.

# කොළඹ සමුළුවෙන් පසුව......

ප්‍රමාණයත්ද මේ රාජ්‍ය හත එකිනෙකට බොහෝ සේ වෙනස්ය. පහත දැක්වෙන සටහනින් එය පැහැදිලි වේ.

| රාජ්‍යය | ජන ගහණය | වගි ප්‍රමාණය වර්ග සැතැප්ම |
|---|---|---|
| 1. ඉන්දියාව | 880503270 | 1269420 |
| 2. පාකිස්තාන | 128256600 | 110403 |
| 3. බංග්ලාදේශ් රාජ්‍යය | 120312877 | 55598 |
| 4. නේපාලය | 19830778 | 54600 |
| 5. ශ්‍රී ලංකාව | 17538112 | 25337 |
| 6. භූතානය | 1567625 | 18000 |
| 7. මාලදිවයින | 224377 | 115 |

මෙසේ සාක් සංවිධානය බාහිර තර්ජනවලට මුණ පෑමේ අදහසින් සකස් වූවක් නොවෙතත් මෙවැනි ඒකාබද්ධ ව්‍යාපාරයක් මගින් සාක් රාජ්‍ය විසින් ඉටුකොට ගත හැකි අභ්‍යන්තර ප්‍රශ්න රැසක් ඇත්තේය.

මේ රාජ්‍ය හතම, තෙවන ලෝකයට– එනම් ඌණ සංවර්ධිත දක්ෂිණ කලාපයට – අයත් රාජ්‍ය වෙති. ආර්ථික හා සාමාජික වශයෙන් මේ රාජ්‍ය පසුවන්නේ දුක්ඛිත තත්ත්වයකයි. සාක් සංවිධානය පිහිටුවා ගැනීමේ ප්‍රධාන අරමුණක්



ගිරිජා ප්‍රසාද් කොයිරාල
(නේපාල අගමැති)

වන්නේ, සහයෝගිතා ව්‍යාපාර මගින් මේ රාජ්‍යන්හි ප්‍රගතිය ජව ගැන්වීමයි. සාක් සංවිධානයෙන් මූර්තිමත් වන්නේ සිය පොදු ප්‍රශ්න නිරාකරණය කොට ගැනීමෙහිලා කලාපීය මට්ටමෙන් සහයෝගිතා පවත්වා ගන්නට මේ රාජ්‍ය හත සතු දැඩි අධිෂ්ඨානයයි. සාමූහික සහයෝගිතාව පිහිටා සිටින්නේ සුහදවම අන්‍යෝන්‍ය විශ්වාසය හා අවබෝධය පදනම්කොට ගෙනයි. මේ සහයෝගිතාවයේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුනොවුන්ට ගරු කිරීම, සමානාත්මතාව හා සුබසෙත බෙදාහදා ගැනීමත් පදනම්කොටගත් නව ජීවන රටාවක් මේ සාක් සංවිධානයට උදාකොට ගැනීමට සාක් නායකයෝ අදහස් කරති.

ශ්‍රී ලංකාව, සාක් සංවිධානයේ පුරෝගාමී රාජ්‍යයකි. 1980 නොවැම්බර් මාසයේදී, සාක් සංවිධානය පිළිබඳ අදහස පළමුවෙන්ම ප්‍රකාශ වූවාට පසුව, එම රාජ්‍ය හතේ විදේශ ලේකම්වරු ප්‍රථමවරට එක්රැස් වූයේ ශ්‍රී ලංකාවේ



නරසිංහ රාවෝ
(ඉන්දියානු අගමැති)

කොළඹදීය. ඒ 1981 අප්‍රේල් මාසයේදීය. එතැන් පටන් සාක් සංවිධානය පිළිබඳ ප්‍රාරම්භක



ජිග්මේ සිංග්යේ වංග්චුක් රජු
(භූතානයේ රජු)

කටයුතු සීඝ්‍ර වේගයෙන් සිදුවීගෙන ගියේය.

## මූලික ප්‍රගතිය

1991 දෙසැම්බර් 21 වනදා කොළඹදී සාක් සවන රාජ්‍ය නායක සමුළුව පැවැත්වෙන තෙක්, සාක් සංවිධානය විසින් ලබාගෙන තිබුණු මූලික ප්‍රගතිය සමාලෝචනය කරනු වටී.

ප්‍රථම සාක් රාජ්‍ය නායක සමුළුවේ ප්‍රධානතම ජයග්‍රහණය නම් සාක් ප්‍රඥප්තිය සම්මත කොට ගැනීමයි. වගන්ති දහයකින් සමන්විත සාක් ප්‍රඥප්තියේ දශවන වගන්තියෙන් කියවෙන්නේ පැවුල ප්‍රතිපත්තියයි. එහිදී පැවුල ප්‍රතිපත්ති දෙකක් සඳහන් වේ.

ඒවා මෙසේය:

1. කවර මට්ටමකින් හෝ තීරණවලට එළඹිය යුතු වන්නේ ඒකමතික භාවය පදනම් කොට ගෙනයි.
2. අන්‍යෝන්‍ය ප්‍රශ්න සහ විවාදයට තුඩුදෙන සුළු ප්‍රශ්නත්, සාකච්ඡා සඳහා ගතයුතු නොවේ.



නවාස් ෂරීප්
(පාකිස්ථාන අගමැති)

මේ පැවුල ප්‍රතිපත්ති සකස්කොට ගන්නා ලද්දේ සංවිධානයේ ස්ථාවර භාවය රැකගන්නා පිණිස බැව්



මවුමූන් අබ්දුල් ගයූම්
(මාලදිවයින ජනාධිපති)

ඉතා පැහැදිලිය. සාක් සංවිධානයේ ආරම්භයේදී, එහි ළාබාල වියේදීම, විවාදයට තුඩුදෙන ප්‍රශ්න සාකච්ඡාවට ගන්නා ලද නම්. සංවිධානයේ ස්ථාවර භාවය දෙදරන්නට ඉඩ තිබුණේය.



ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස
ජනාධිපතිතුමා

සංවිධානය ස්ථාවරව පිහිටියාට පසුව, කවර ආකාරයෙක හෝ තියුණු මතභේදයකට වුවද, ඔරොත්තු



බෙගම් කලීඩා සියා
(බංගලිදේශ අගමැති)

දී සිටින්නට එය සමත්වනු නොඅනුමානයි.

ප්‍රථම සාක් රාජ්‍ය නායක සමුළුවේ පටන්ම, පුන පුනා පැන නගින ප්‍රශ්නයක් නම් ත්‍රස්තවාදය පිළිබඳ අර්බුදයයි. 1988 අගෝස්තු මාසයේදී ත්‍රස්තවාදය මැඩලීම පිළිබඳ 'සාක් කලාපීය සම්මුතිය සකස් කොට ගන්නා ලදී.

සාක් සංවිධානයේ ක්‍රියාශීලීත්වයට ඉතාම ව්‍යක්ත නිදර්ශනයක් සැපයෙන්නේ 'සාක් ධාන්‍ය සංචිතයක් පිහිටුවාලීමේ ගිවිසුමෙනි. මේ ගිවිසුම අත්සන් කරන ලද්දේ 1987 නොවැම්බර් මාසයේදී බන්මණ්ඩුවේ සාක් රාජ්‍ය නායක සමුළුව පැවැති අවස්ථාවේදීය. ඉන් නව මසකින් පසුව, 1988 අගෝස්තු මාසයේදී ඒ ධාන්‍ය සංචිතය පිහිටුවන ලදී. ඉතා ක්ෂණික ලෙස අදහස් යෝජනා ආදිය ක්‍රියාවේ යෙදවීමෙහිලා, සාක් සංවිධානය සතු ප්‍රවීනත්වයට මෙය

# කොළඹ සමුළුවෙන් පසුව......



1987 ඉන්දියාවේ බැංගලෝර් හී පැවති සාක් රාජ්‍ය නායක සමුළුවට සහභාගී වූ රාජ්‍ය නායකයෝ

ඉතා හොඳ නිදසුනකි. දැනට මේ ධාන්‍ය සංචිතයෙහි ආහාර ධාන්‍ය ටොන් 250,000ක් පමණ එක් රැස්වී ඇත්තේය. එක් එක් සාක් දේශය විසින් ඒ ධාන්‍ය සංචිතයට එකතු කරනු ලබන ධාන්‍ය ප්‍රමාණය ඒ ඒ එටෙහිම තැන්පත් වේ. යම්කිසි සාක් දේශයකට, ස්වාභාවික ව්‍යසනයක් නිසා හෝ වේවා. සෙසු හේතුවක් නිසා හෝ වේවා හදිසි ආහාර හිඟයක් සිදුවුවහොත්, එවැනි ආපදාවලින් සහනය ලබාගන්නා පිණිස මේ ධාන්‍ය සංචිතයේ ආධාරය ලබාගත හැකිවේ.

මත්ද්‍රව්‍ය මැඩලීම පිළිබඳවත් සාක් සම්මුතියක් සකස් වී ඇත්තේය.

## භාරදූර කාර්යය

1991 දෙසැම්බර් මාසයේදී සාක් සංවිධානයේ සභාපතිත්වය, ශ්‍රී ලංකාවේ ගරු රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමන්ට පිරිනැමුණේය.

1991 – 1992 වර්ෂය සාක් ඉතිහාසයෙහි අතිශයින් වැදගත් වර්ෂයක් වෙයි. විසිඑක්වන ශත වර්ෂයට මුහුණපානු පිණිස සාක් සංවිධානය හැඩගස්සා ගැනීමේ භාරදූර කාර්යය, ඉදිරි මාසයන්හිදී උද්ගතවන ප්‍රධාන අභියෝගයකි.

විසි එක්වන ශත වර්ෂයට මුණපානු පිණිස සාක් රාජ්‍ය විසින් අනුගමනය කෙරෙන ක්‍රියා මාර්ග අන්තර්ගත වාර්තා සාක් රාජ්‍ය විසින් දැනටමත් සකස් කොට ඇත්තේය. ඒවා සංකලනය කොට පොදු සම්මුතියකට අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග තෝරා ගැනීම ත් ඒවා ක්‍රියාවේ යෙදීම සඳහා අවශ්‍ය විධි සහ ක්‍රම සකස් කොට ගැනීමත්, නුදුරු අනාගතයේදී සාක් රාජ්‍යයන්ට මුහුපාන්නට සිදුවන අභියෝග අතර වෙති.

1988 දී පාකිස්තානයේ ඉස්ලාමාබාද්හි පැවැත්වුණු සිව්වන සාක් රාජ්‍ය නායක සමුළුවේදී උද්ගත වූ අදහසකට අනුව, සාක් රාජ්‍ය විසින් 'සාක් 2000 මූලික අවශ්‍යතා පිළිබඳ දර්ශනයක්' නමැති වාර්තාවක් සැපයේ. මෙය සාක් රාජ්‍යයන්හි අනාගතය පිළිබඳ සැලැස්මක් වැනිවෙයි. මේ ලේඛනය ක්‍රමවත්ව සකස් කිරීමත්, එහි අන්තර්ගත සැලසුම් ක්‍රියාවේ යොදවන මාර්ග නිර්දේශ කිරීමත් ලබන මාස කිහිපය තුළදී සාක් සංවිධානය හමුවට පත්වන ප්‍රධාන කරුණුයි.

පාරිසරික ප්‍රශ්න — වෙසෙසින්ම ගිම්හල් න්‍යායය — නිවාස සම්පාදනය ආදි සාක් අර්බුද පිළිබඳවද නොබෝ කලකින් සාක් රාජ්‍යයන්ට සිත් යොමු කරන්නට සිදුවේ.

සාක් සංවිධානයේ වර්තමාන සභාපතිත්වය දරණ ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා විසින් ඉදිරිපත් කොට තිබෙන ප්‍රබල යෝජනාවක්ද නොබෝ කලකින් ක්‍රියාවේ යෙදවෙයි. ඒ යෝජනාවෙන් කියවෙන්නේ, සාක් රාජ්‍යයන්හි දිළිඳුබව පිටුදක්නා පිණිස – දරිද්‍රතා මැඩලීමේ සාක් කොමිසමේ සාමාජිකත්වය ලබන්නේ ඒ ඒ සාක් රාජ්‍යය විසින් තෝරා ගනු ලබන විශේෂඥයින් කිහිපදෙනෙකි.

සාක් සහභාගිත්වය පිළිගනිමින් ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කෙරෙන ඒ යෝජනාව, මෙතෙක් වචින් – පිටින් පමණක් සාකච්ඡා කෙරුණු මූලික සාක් අර්බුදයේ මුල හරිහැටි සොයාගැනීමකි.

## අත්තිවාරම

සාක් සංවිධානය විසින් පසුගිය හය අවුරුද්ද තුළ ඉටුකොට තිබෙන කටයුතුවලින් ප්‍රධාන තැනක් ගන්නේ, සාක්හි සංවිධානමය පදනම ස්ථාවර කොට ගැනීමයි. මෙතරම් සුළු කාලයකදී, සාක් ආයතනය උදෙසා ප්‍රබල සංවිධානමය අත්තිවාරමක් සකස් කොට ගත හැකිවීම ප්‍රශස්ත ජයග්‍රහණයකි.

1987 ජනවාරි 16 වනදා නේපාලයේ කත්මණ්ඩු නගරයෙහිදී සාක් ලේඛකාධිකාරය පිහිටුවන ලදී. එහි ප්‍රාරම්භක මහ ලේකම්වරයා වූයේ බංග්ලාදේශ් රාජ්‍යයේ අබුල් අන්සාන්ය. 1989 දී ඔහු පදවියෙන් බැහැර වූවිට, දෙවර්ෂයක රාජකාරි කාලය සඳහා පත්වූ දෙවන සාක් මහලේකම්වරයා වූයේ ඉන්දියාවේ කාජන් කිෂෝර් භාර්ගවයි. ඔහු ගෙන් පසුව 1992 ජනවාරියේ දෙවසක රාජකාරි කාලය උදෙසා සාක් මහ ලේකම් පදවිය ලද්දේ මාලදිවයින් රාජ්‍යයේ ඊබ්‍රහිම් හුසේන් සාකිය. ඔහුගේ පාලන සමය නිමාවන්නේ 1994 ජනවාරියේදිය.

සාක් සංවිධානය විසින් එහි උදාරතර පරමාර්ථ ඉටුකොට ගෙන සාක් රාජ්‍ය හතේ වෙසෙන ජගත් ජනගහණයෙන් පහෙන් පංගුවක් පමණ වන ජනකාය සුඛිත – මුදිත කළ හැක්කේ සාක් ව්‍යාපාරය ජනතාව අතරට පත්ව එහි මූලික පරමාර්ථ හා පොදු අරමුණු සඳහා ජනතා සහයෝගය ලැබෙතොත් පමණි.

ඒ නිසා සාක් අදහස, සාක් ජනතාව වෙත ගෙන යෑම ඉතා වැදගති. දැනටමත් සාක් ශ්‍රව්‍ය – දෘශ්‍ය ගනුදෙනුව (සේවා) ගැන වැඩපිළිවෙල මගින් මෙය තරමකට ඉටුවේ.

ආසියාවේ ජනතා නායකයෙකු වශයෙන් කීර්තියක් උසුලන ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ සභාපතිත්වය පිළිබඳ යුගයේදී සාක් ව්‍යාපාරය ජනතා බලවේගයක් වී එය 'සාක් සවිය' බවට පත්වේයැයි මම සිතමි.